රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 41/94

මගේ අංකය :- එච්ප්/ඩීප්/2/4/93/94,
1994.12.27 දින,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම ප්‍රධාන ලේකම්වරුන්/ආණ්ඩුකාරතුමාගේ ලේකම්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියළුම දිසාපති/දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්.

## ප්‍රාදේශීය පරිපාලනය විධිමත් කිරීම.

ප්‍රාදේශීය පරිපාලනය විධිමත් කිරීම සඳහා රජය විසින් ගන්නා ලද පහත සඳහන් තීරණ 1995 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන සේ ක්‍රියාත්මක වේ.

(1) සියළුම අමාත්‍යාංශවල හා දෙපාර්තමේන්තුවල ප්‍රාදේශීය ලේකම්වරුන් මගින් ක්‍රියාත්මක වන කටයුතු දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන් මාර්ගයෙන් සම්බන්ධීකරණය කිරීම.

(2) දිස්ත්‍රික් සංවර්ධනය සඳහා යෙදවෙන සියළුම රජයේ මුදල් දිස්ත්‍රික් ලේකම්/දිසාපති මගින් ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහාය ඇතිව ක්‍රියාත්මක කිරීම. දැනට ක්‍රියාත්මක වන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු මෙහිදී වඩාත් ශක්තිමත්ව දිස්ත්‍රික් සංවර්ධන කටයුතු ඉටු කිරීම සඳහා යොදවනු ඇත. ප්‍රාදේශීය ලේකම් මට්ටමින් ප්‍රාදේශීය සංවර්ධන සැළැස්ම තවදුරටත් ක්‍රියාත්මන වන අතර, දිස්ත්‍රික් ඒකාබද්ධ සැළැස්ම එම සැළසුම් ඒකාබද්ධ වීමෙන් සකස්වනු ඇත.

(3) පරිපාලනමය වශයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අධීක්ෂණය හා සම්බන්ධීකරණය දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන් වෙත පැවරෙනු ඇත. මෙහිදී ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ,

I. ඉදිරි වැඩසටහන් අනුමත කිරීම.
II. වැටුප වර්ධක නිර්දේශ කිරීම.
III. නිවාඩු අනුමත කිරීම.
IV. නිවාඩු දින රාජකාරි සඳහා අනුමැතිය දීම.

යන කටයුතු මින් ඉදිරියට දිස්ත්‍රික් ලේකම්/දිසාපති විසින් ඉටු කරනු ඇත.

(4) ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉටු කරනු ලබන රාජකාරි වලට අදාල තීරණ සම්බන්ධයෙන් අභියාචනා විභාග කිරීම හා ඒ සම්බන්ධව අවශ්‍ය පියවර ගැනීම දිස්ත්‍රික් ලේකම්/දිසාපති වෙත පැවරේ.

(5) ග්‍රාම නිලධාරීන්ගේ එදිනෙද රාජකාරි අධීක්ෂණය ප්‍රාදේශීය ලේකම් වෙත පැවරෙන අතර, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ඇතුලත ස්ථාන මාරු ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. දිස්ත්‍රික් මට්ටමේ ස්ථානමාරු සම්බන්ධයෙන් තීරණ දිස්ත්‍රික් ලේකම්වරයා/දිසාපතිවරයා විසින් ගනු ඇත. ග්‍රාම නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අභියාචනා පිළිබඳ තීරණ ගැනීමේ බලය දිස්ත්‍රික් ලේකම්/දිසාපති වෙත පැවරේ.

(6) දිස්ත්‍රික් ලේකම්/දිසාපති යටතේ පවත්වාගෙන යනු ලබන අභ්‍යන්තර විගණන ඒකකයක් මඟින් සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ඇත.

අ.කලේ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
වැවිලි කර්මාන්ත හා
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.